**ශීර්ෂය - 241- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්මේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 ආදායම් කළමනාකරණය**

**--------------------------**

**2.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා**

**--------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------------- | ----------- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2002:03:00 ආදායම් සංකේතයේ හා 2002:04:00 ආදායම් සංකේතයේ දක්වා ඇති මූලික ඇස්තමේන්තුව හා 2020 වර්ෂයේ අනුමත මූලික ඇස්තමේන්තුව අතර පිළිවෙලින් රු.මි. 28,173 කින් සහ රු.මි.1,971 කින් වෙනසක් නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුවේ සඳහන් ආදායම වෙනුවට මූලික ඇස්තමේන්තුවේ ආදායම් ප්‍රමාණය ඇතුළත් කිරීම මෙයට හේතු විය. | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති බවට ගිණුමේ දක්වා ඇතත් ඊට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. | ඇස්තමේන්තු ආදායම් මු.රෙ. 85 (2) පරිදි වර්ෂය මැදදී සංශෝධනය කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අනුමැතිය ලබාදීමක් නොකෙරේ. | විධිමත් අනුමැතීන් මත ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කළයුතු වීම. |
| (ඇ) | ඒ අනුව එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ තත්‍ය ආදායම පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |

**I. <u>ආදායම් සංකේතාංකය</u>**

**<u>20:02:03-ලාභ</u>**

| | | |
|---|---|---|
| i. 2020 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 30,961 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 14,768 ක් වීම හේතුවෙන් එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 48 ක් වී තිබුණි. | ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | වියදම කුමන මට්ටමක තබාගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස්කරගැනීම වාර්තා තබාගැනීම විධිමත් කළ යුතුය. |
| ii. | ආයතන 7 කට අදාලව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම ප්‍රතිශතයක් ලෙස සියයට 33 ත් 84 ත් අතර පරාසයක පැවතුණි. | සියලුම රාජ්‍ය ව්‍යාපාරවලින් රජයේ ලාභ හා ලාභාංශ අයකරනු නොලැබේ. | -එම- |
| iii. | ආයතන 12 ක් මගින් 2020 වර්ෂය තුලදී රු.මිලියන 1,398 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් එකී ආයතන විසින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | -එම- | -එම- |
| iv. | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය හා ජාතික ලොතරැයි මණ්ඩලය යන ආයතන 03 න් පසුගිය වර්ෂ 03 කට අධික කාලයක සිට ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබාගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස්කරගැනීම වාර්තා තබාගැනීම විධිමත් කළ යුතුය. |
| v. | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, මහජන බැංකුව විසින් 2020 වර්ෂය සඳහා අනුමත කරන ලද රු.බිලියන 01 ක් වූ අයබදු වට්නාකම මගින් මිහින් ලංකා සමාගම වෙනුවෙන් නිකුත් | මහජන බැංකුව වෙත මිහින් ලංකා ආයතනයෙන් ලැබිය යුතු ණය වාරිකයෙන් කොටසක් හා සම්පූර්ණ උපචිත පොළිය කපා හැරීම වෙනුවෙන් ලද මුදල මහජන | රාජ්‍ය ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත් විධිමත් ප්‍රතිපාදන මත අදාල ගෙවීම් සිදු කිරීමටත් හැකිවන පරිදි විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ රු.මිලියන 1,650 ක සහන ලිපියට අදාල පොළිය රු. මිලියන 909 ක් හා ප්‍රාග්ධන මුදලින් රු.මිලියන 90.9 ක් නිරවුල් කිරීම සඳහා භාවිතා කරන ලද බව මහජන බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙත දන්වා තිබුණි. ඒ අනුව එම නිරවුල් කිරීම 2020 දෙසැම්බර් 31 දිනැතිව මාරු පත්‍රයක් මඟින් ගිණුම්වලට ගලපා තිබුණි. | බැංකුව විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබූ රු.මිලියන 1000 ක ලාභ ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇත. | |
| **II.** | **<u>ආදායම් සංකේතාංකය 20.02.04 - ලාභාංශ ආදායම</u>** | | |
| i. | 2020 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 4,918 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 2,855 ක් වීම හේතුවෙන් එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 58 කි. | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් බලපෑම් එල්ලවීම හා ලාභාංශ ප්‍රමාණය අදාළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම හේතුවී ඇත. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබාගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස්කරගැනීම වාර්තා තබාගැනීම විධිමත් කළ යුතුය. |
| ii. | ආයතන 2 කට අදාලව ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 65 සිට සියයට 80 දක්වා පරාසයකින් තත්‍ය ආදායම අඩුවී තිබුණි. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | -එම- |
| iii. | වර්ෂය සඳහා ආයතන 14 ක් රු. මිලියන 1,074 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර එම ආයතනවලින් සමාලෝචිත වර්ෂය තුලදී ලාභාංශ ආදායමට කිසිඳු දායකත්වයක් ලබා දී නොතිබුණි. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | -එම- |
| iv. | පහත සඳහන් ආයතන පසුගිය වර්ෂ කිහිපය තුළ ලාභාංශ ආදායමට කිසිඳු දායකත්වයක් ලබාදී නොතිබුණි. | -එම- | -එම- |

- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
- කහටගල ග්‍රැෆයිට් ලංකා සමාගම
- ලංකා සීනි සමාගම
- ලංකා ලොජිස්ටික් සමාගම
- ලංකා ත්‍රිපෝෂ සමාගම

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයක් සඳහා වෙන්කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වැය නොකර වර්ෂය අවසානයේ සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | එක් වැය විෂයයක් යටතේ පූගොඩ ටෙක්ස්ටයිල් ආයතනයේ වන්දිලාභීන් වෙත වන්දි ගෙවීමට වෙන්වූ මුදල කොවිඩ් වසංගතය නිසා සංචරණ සීමා පැනවීම හේතුවෙන් ඉතිරි වූ අතර තවත් වැය විෂයයක කල්බදු වාරික ගෙවීම සඳහා වෙන්වූ ප්‍රතිපාදනය, මෝටර් රථය අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත මාරු කිරීම නිසා ඉතිරි විය. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කළ යුතු වීම. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී එක් වැය විෂයයක විචලතාවය සියයට 25 ක් විය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙවැනි විචලතා සාමාන්‍ය සිද්ධියකි. | -එම- |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 08 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කල පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය හේතුවෙන් මෙහෙයුම් කටයුතු සීමා වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2020 වර්ෂය තුළ අංක 2301 දරන හිමිකම් දායක මුදල් වැය විෂයය යටතේ සමාගම් 02 ක ආරම්භක ප්‍රාග්ධනය සඳහා ලබා දී තිබූ රු.40,000,000 ක් වූ චෙක්පත් අදාල සමාගම් සංස්ථාපනය කළද, මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැති වීම හේතුවෙන් 2021 ජූනි 16 වන තෙක් එම සමාගම් වෙත භාරදී නොතිබුණි. | චෙක්පත් භාරදීම 2021.06.17 දින සිදු කර ඇත. | කාර්යක්ෂමව හා ඵලදායීව ආයෝජනය සිදු කළයුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක ප්‍රාග්ධනයක් ලෙස රු.මිලියන 48,000 ක් ලබාදී තිබුණද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල මඟින් කරන ලද අතිරේක ප්‍රාග්ධන සම්පාදනයකි. | ඒකාබද්ධ අරමුදල හරහා සිදුකරනු ලබන ගෙවීම් සඳහා සුදුසු ප්‍රතිපාදන සලසා ගතයුතු වීම. |
| (ඊ) | දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාර වෙත සිදුකරන ලද ප්‍රාග්ධන දායකත්වය, අදාල ආයතන විසින් නිවැරදිව ගිණුම් ගත කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විධිමත් මහපෙන්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය නොවීය. | ප්‍රාග්ධන දායකත්වයන් ලබාදෙන අවස්ථාවේ එම මුදල් අතිරේක ප්‍රාග්ධනයක් ලෙස සලකා ගිණුම්ගත කිරීමට ලිඛිතව දැනුම් දී ඇත. | විධිමත් මහපෙන්වීම් යටතේ ප්‍රාග්ධන දායකත්වය ගිණුම් ගත වන බව තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් සකස් කළයුතු වීම. |
| (උ) | රජය විසින් ලබාදෙනු ලබන පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම පිළිබඳව නිසි අධීක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබූ බව නිරික්ෂණය නොවීය. | විශ්ලේෂණය කරන අවස්ථාවේ ගිණුම්ගත කිරීමේ අඩුපාඩු පවතීනම් ඒවා නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. | පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් ගත කිරීම අධීක්ෂණය විධිමත් කළයුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කලයුතු වුවත් | | |

විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබීම හේතුවෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| i. වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම රු.6,233,903 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු.2,870,051 ක් වීමෙන් රු.3,363,852 කින් මුදල් ගලා ඒම අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| ii. අත්තිකාරම් ගෙවීම් රු.4,778,054 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.2,249,540 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 2,528,514 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටමට ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මඟින් පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසුවිපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහය වීම යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර නොතිබුණි. | එකඟ වෙමි. 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. |
| (ආ) දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාවේ 2019 වර්ෂයේ 01 වන පරිච්ඡේදයේ 1.1 හි සහ 2020 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 01 පරිච්ඡේදයේ 1.1 හැඳින්වීම යටතේ සඳහන් කර ඇති රජය සතු ව්‍යාපාර 396 ක් පවතින බවත් ඉන් 280 ක් දෙපාර්තමේන්තුව විසින් අධික්ෂණය කරනු ලබන බවත් දක්වා | එකඟ වෙමි. අදාළ සංශෝධනයන් 2021 කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන යායුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. කෙසේ වුවද දෙපාර්තමේන්තුව විසින්ම විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රජය සතු ව්‍යාපාර 417 ක් පවතින බවත් ඉන් දෙපාර්තමේන්තුව විසින් ආයතන 300 ක් අධීක්ෂණය කරනු ලබන බවත් දන්වා තිබුණි. | | |
| (ඇ) | එසේ වුවද, ඉහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර 300 න් 118 ක් පමණක් මේ වනවිට දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය කෙරෙමින් පවතින බව විගණනයට දන්වා තිබුණි. | එකඟ වෙමි. | අධීක්ෂණයට යටත් කළයුතු රාජ්‍ය ව්‍යාපාරවලට අදාළව පැහැදිලි නිර්නායකයන් හඳුනාගත හැකිවිය යුතුවීම. |
| (ඈ) | එම රාජ්‍ය ව්‍යාපාර 118 තුළ අලාභ ලබමින් පවතින ආයතන 33 ක් විය. ආයතන අලාභ ලබා ඇති විට ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම කෙසේද යන්න පිළිබඳව විගණනයෙන් විමසා සිටියද, ඊට පිළිතුරු ලෙස අවශ්‍ය උපදෙස් සැපයීම් හා ආයතන දැනුවත් කිරීම් සිදුකරන බව දන්වා තිබුණද, ඊට අදාළ පසුවිපරම් කිරීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | උපදෙස් සැපයීම හා ආයතන දැනුවත් කිරීම්වලට අදාළ පසුවිපරම් කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරමින් පැවති ව්‍යාපාර 118 න් ආයතන 18 ක මූල්‍ය ප්‍රකාශන හෝ ඉදිරිපත් වි නොමැති බව විගණනයට දන්වා තිබුණු අතර ඉන් සමහර ආයතනවල වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රකාශනද ඉදිරිපත් වි නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | -එම- |
| (ඊ) | 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | **I. 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොමැති ක්‍රියාකාරකම්**<br>• ක්‍රියාකාරී සැලැස්මේ 1.3 යටතේ දක්වා ඇති පරිදි රජය සතු ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද පරිපාලන සංග්‍රහයන් (Administrative Manual) සඳහා | 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. 2020 වර්ෂයේ පැතිර ගිය කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂා කර තිබූ බොහෝ ක්‍රියාකාරකම් අපේක්ෂිත මට්ටමින් ලඟාකර ගැනීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

අනුමැතිය ලබාදීම.

- සාමූහික ගිවිසුම් (Collective Agreement) අළුත් කිරීම සඳහා පහසුකම් සැපයීම.
- සමාගම් පනත, යහපාලන මාර්ගෝපදේශ විගණිත හා කළමනාකරණ කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**II. 2019 කාර්යසාධන වාර්තාව අනුව, 2019 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු තුළ අවසන් කිරීමට සැලසුම් කර තිබූ 2020 වර්ෂය අවසාන වනවිටත් සම්පූර්ණ කර නොමැති ක්‍රියාකාරකම් පහත පරිදි විය.**

| | | | |
|---|---|---|---|
| **i.** | ලාභාංශ ප්‍රතිපත්තිය | 2021 අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ආයතනයන් අදාළ මාර්ගෝපදේශ සකස් කර ඇති බව දක්වා ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **ii.** | ප්‍රසාද දීමනා ප්‍රතිපත්තිය | | |
| **iii.** | යහපාලනය පිළිබඳ යාවත්කාලීන මාර්ගෝපදේශ සංග්‍රහය 2002 වර්ෂයේදි දෙපාර්තමේන්තුව ප්‍රතිස්ථාපණය කිරිමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ආරම්භක වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසායන් (07) හතක් සඳහා සහ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරිමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයොජන බැංකුව, ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයොජන මණ්ඩලය වැනි ව්‍යවස්ථාපිත ආයතන පාලනය කිරීම සඳහා මෙම මාර්ගෝපදේශය නිකුත් කළයුතු වුවද ඊට අදාළ යාවත්කාලීන මාර්ගෝපදේශයක් මෙතෙක් | අමාත්‍ය මණ්ඩල සටහන් ඇතුළත් ආයතන මෙන්ම අනෙකුත් ආයතන ආවරණය වන පරිදි යහපාලන මාර්ගෝපදේශයන් මේ වනවිට සකස් කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබුණි.<br>iv. ආදායම් ප්‍රතිපත්තිය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය<br>v. පරිපාලන අත්පොත් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය | ඉහත මාර්ගෝපදේශ තුළ මෙම සියලු මාර්ගෝපදේශ ඇතුළත් වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළයුතුවීම. |
| (උ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණයට ලක්වන ආයතන 300 කින් ආයතන 121 ක දත්ත ඇතුළත්වීමේ වැඩකටයුතු නිමකිරීම සියයට 40 ක් පමණක් විය. | මෙම දත්ත පද්ධතිය සකස් කර ඇත්තේ ප්‍රදාන වශයෙන් අධීක්ෂණය කරන රාජ්‍ය ව්‍යාපාර 126 සඳහාය. ඒ අනුව අදියර 2 දී ආයතන 119 ආවරණය කර ඇත. | නිවැරදි යාවත්කාලීන දත්ත හා තොරතුරු පවත්වාගත යුතුවීම හා ඒ මත අවශ්‍ය අධීක්ෂණය සිදු කළ යුතුවීම. |
| (ඌ) | 2020 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 07 පරිච්ඡේදයේ 17.2 කරුණ අනුව, ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා සැපයීම තුළින් මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසාදීම යන්නට, "අනුකූලවේ" යන්න දක්වා තිබුණි. ඉහත කී පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාළ දත්ත පද්ධතිය සකස් කිරීමක් මෙතෙක් අවසන් වී නොමැති බැවින් එම "අනුකූලවේ" යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. | මෙම දත්ත පද්ධතිය සකස් කර ඇත්තේ ප්‍රදාන වශයෙන් අධීක්ෂණය කරන රාජ්‍ය ව්‍යාපාර 126 සඳහාය. ඒ අනුව අදියර 2 දී ආයතන 119 ආවරණය කර ඇත. | -එම- |
| (එ) | 2019 වර්ෂයෙහි රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි ලාභ ආදායම හා ලාභාංශ ආදායම පිළිවෙලින් රු.මිලියන 22,833 ක් හා රු.මිලියන 5,024 ක් වූ අතර 2020 වර්ෂයේ එය පිළිවෙලින් රු. මිලියන 14,708 ක් සහ රු. මිලියන 2,855 දක්වා සියයට 36 කින් හා 44 කින් පහළ බැස තිබුණි. 2020 මූල්‍ය ප්‍රකාශනවල ආදායම් සංකේත 20:02:03 (ලාභ) යටතේ ආයතන 33 ක විස්තර ඇතුළත්ව තිබූ අතර ආදායම් සංකේත 20:02:04 (ලාභාංශ) යටතේ ආයතන 43 ක් දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රජයේ වාණිජ වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාව 206 කි. මේ අනුව රාජ්‍ය ව්‍යාපාර 150 කට අධික සංඛ්‍යාවක ආදායම/ ලාභය/ අලාභය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර ඊට හේතු ඉදිරිපත් නොවීය. | කොවිඩ් වසංගතය හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීමට හේතු වී ඇත. සියලුම රාජ්‍ය ව්‍යාපාරවල ලාභ හා ලාභාංශ අයකරනු නොලබන අතර ලාභාංශ තීරණය කරනු ලබන්නේ අදාළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. | -එම- |
| (ඒ) | රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධන මට්ටම | කොවිඩ් වසංගතය හේතුවෙන් | නිවැරදි මඟපෙන්වීම් හා |

| | | | |
|---|---|---|---|
| | සීඝ්‍ර පසුබෑමකට ලක්ව ඇති බව ලාභ ආදායම හා ලාභාංශ අඩුවීම මඟින් නිරීක්ෂණය විය. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය අධීක්ෂණයට අදාළව අභ්‍යන්තර හා භාණ්ඩාගාර නියෝජිතයන් සඳහා ලබාදුන් පුහුණුව සැලකිල්ලට ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාරවල තීරණ තීන්දු ගැනීමට මැදිහත්වීමේදී අදාළ වන අණ පනත් සහ චක්‍රලේඛ ප්‍රතිපාදන සම්බන්ධයෙන් නව භාණ්ඩාගාර නියෝජිතයන් 100 ක් සඳහා 2020 ජනවාරි 30 දින පුහුණු වැඩමුළුවක් පවත්වා තිබුණි. මෙහි දෙවන අදියර ලෙස තවත් නියෝජිතයන් 100 ක් සඳහා පෙබරවාරි මාසයේදී වැඩමුළුවක් පවත්වා ඇතත් ඉන්පසු ගතවූ 2020 වර්ෂය පුරාවට කිසිඳු වැඩමුළුවක් පවත්වා නොතිබීම හේතුවෙන් ඒ සඳහා ක්‍රියාකළ බවක් විගණනයේදී නිරීක්ෂණය නොවීය. | මාර්තුවලින් පසු වැඩමුළු පැවැත්වීමට නොහැකි විය. | උපදෙස් ලබාදෙමින් රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම. |
| (ඔ) | රාජ්‍ය ආයතනවල කාර්යසාධන අධීක්ෂණයට අදාළව එම ආයතනවල සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීමට සැලසුම් කර තිබුණද, විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව රජය සතු ව්‍යාපාර 300 අතුරින් දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේ සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කිරීම ද ඉතා අවම මට්ටමක පැවතුණි. | 2020 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් අපේක්ෂිත මට්ටමින් සමාලෝචනයට ඉදිරිපත් නොවුණි. | විධිමත් උපදෙස් ලබාදෙමින් තොරතුරු ගෙන්වා ගැනීම හා ඒවා සමාලෝචනය විධිමත් කිරීම. |
| (ඕ) | රාජ්‍ය ව්‍යාපාරවල පවතින ප්‍රධාන ගැටළු විසදීම සඳහා වැවිලි හැර කෘෂි අංශයේ අනෙකුත් ආයතන සඳහා 2020 වර්ෂය තුළදී එක් සාකච්ඡා වාරයක් සහ ව්‍යාපාර කිහිපයක් වෙනුවෙන් සාකච්ඡා වාර 02 ක් ද පවත්වා තිබුණි. එහෙත් ප්‍රතිපත්ති අංශයේ ව්‍යාපාරවල පවතින අධික කාර්යය මණ්ඩලය නිසා සේවක පිරිවැය අධික වීම, ආයතනයන්හි යහපාලන දුර්වලතා සහ අභිප්‍රේරණය නොවූ සේවක මණ්ඩලයක් සමඟ කටයුතු කිරීමේ ගැටළු වැනි බරපතල ගැටළු විසදීම සඳහා 2020 වර්ෂය තුළදී කිසිඳු රැස්වීමක් පවත්වා නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම් කල පරිදි වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. | බරපතල ගැටළු පවතින ආයතන පිළිබඳ ප්‍රමුඛ ස්ථාන ලබාදෙමින් අදාළ මඟපෙන්වීම් ලබාදීම. |